# ටිකිරි සහ බූලා



උපන්යා ඉන්ජල් ගුණසේකර

# පිදුම

සිප්සතර හැදෑරීමට මහාමායා විදුබිමට පැමිණ අත්පොත් තැබූ මා හට සිප්සයුරේ කිමිද, සියල්ල අතැඹුලක් සේ දැනගැනීමටත්, යහපත් මහාමායා දියණියක සේ මාගේ ජීවිතය අර්ථවත් කර ගැනීමටත්, ගුරුමෑණියනි, ඔබතුමියගේ ඔවදන් සහ මගපෙන්වීම මහත් පිටුවහලක් විය.

එසේ හෙයින් මාගේ පන්තිභාර ගුරුමෑණියන් වන රේණුකා රාජපක්ෂ ගුරුමෑණියන්ට තුති සිතින් ඉතා ගෞරවණීය ලෙස මාගේ මේ පොත් පිංච පුදදෙමි.

# ස්තුතිය

මා විසින් මුල්වරට ලියන ලද “ටිකිරි සහ බූලා” නම් මෙම කෘතිය සාර්ථකව නිම කිරීම සඳහා මා හට ගුරුහරුකම් දෙමින් මාව දිරිමත් කළ මාගේ ආදරණීය දෙමාපියන්ටත්, මාගේ පන්තිභාර ගුරුතුමිය වන රේණුකා රාජපක්ෂ ගුරුමෑණියන්ටත් මෙම කෘතිය සාර්ථකව නිම කර ගැනීම සඳහා අතහිත දුන් සැමටත් මාගේ ගෞරවාදර ස්තුතිය මෙයින් පුද කරමි.

උපන්‍යා ඉන්ජල් ගුණසේකර
2 ශ්‍රේණිය
මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-612-7

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයේන උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023.11.01

එකෝමත් එක කාලෙක

ළමයෙක් හිටියා.

මේ ළමයාගේ නම

තමයි ටිකිරි.



විකිරිට බලු පැටියෙක් හිටියා.

මේ බලු පැටියාගේ නම බූලා.

දවස් ගත වුණා.

දවසක් ටිකිරියි බූලයි

සෙල්ලම් කර කර

ඉන්න කොට

ටිකිරි වැටුණා.



බූලා ඉක්මනින් ගිහින්

ටිකිරිගේ අම්මාව

එක්කගෙන

ආවා.

අම්මා ටිකිරිගේ

තුවාලයට

බෙහෙත් කළා.



අම්මා කිවුවා

“ඔයාට මාසයක් යනකන්

ඇවිදින්න බැහැ කියලා”.

ටිකිරිට හරිම දුකයි.

බූලාවත් හරිම දුකයි.

කාලය ගත වුණා.

ටිකිරිට ඇවිදින්න

පුළුවන් වුණා.

මූලාට හරිම සතුටුයි.

පිකිරිටත් හරිම සතුටුයි.

පිකිරි බූලාගේ

ඔළුව අත ගෑවා.



ටිකිරියි බූලයි

සෙල්ලම් කරලා සතුටින්

ජීවත් වුණා.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

ISBN 978-624-206-612-7

9786242066127